# නිර්මාණ Nirmana

## ගොපළු ගමේ ජේසු උපන්නා

කන්ද උඩින් රැය එනවා
තරු නිවි නිවි දැල්වෙනවා
බෙත්ලෙහෙමේ ගොපළු ගමේ ජේසු උපන්නා
සීත රැයක සිසිර සමේ
පෙර පවුලක ජම්ම ගමේ
බෙත්ලෙහෙමේ ගොපළු ගමේ ජේසු උපන්නා

තරුණ මවට තුරුළු වෙලා
නයන අයා අවට බලා
බෙත්ලෙහෙමේ ගොපළු ගමේ ජේසු උපන්නා
ගොපළු නලා පිඹිනු ඇසේ
ගෙදර දොරේ එළිය දිසේ
බෙත්ලෙහෙමේ ගොපළු ගමේ ජේසු උපන්නා

බැටළු රාශි තණ කමිනේ
කඳු අතරේ සිටිනු පෙනේ
බෙත්ලෙහෙමේ ගොපළුගමේ ජේසු උපන්නා
ගුවන රැයේ ගීතවෙලා
පොඩි බිළිඳා සීත වෙලා
බෙත්ලෙහෙමේ ගොපළු ගමේ ජේසු උපන්නා

මගෙ නත්තල දුගියා බත් කන දාය
මගෙ නත්තල වැරහැලි නැතිවන දාය
මගෙ නත්තල ඔබෙ සිත සැනසෙන දාය
මගෙ නත්තල පව පල්ලිය යන දාය

♦ දිවංගත
ගරු මර්සලින් ජයකොඩි පියතුමා

## අගනා කාලය

වසන්තය පරිදි දස අත මල් පිපෙන
පැමිණේ තුරුණු විය මවමින් මල් සිහින
මංපෙත් මල්පියලි අතුරාගෙන තිබෙන
සනසයි තරුණ ජීවිතයෙදි යන ගමන

අනාගත සිහින සිත ගිය තැන මැවෙනා
සිහිනෙකි තුරුණු විය ජීවිතයෙදි ලැබෙනා
ගිය විට තුරුණු විය ඒ සිහිනෙද බිඳෙනා
සැබෑ ලොවට පිවිසෙයි ජීවිත ගමනා

රසවත් වුව සිහින සහවාගත නොහැක
සැබෑ දිවියෙ නීරස තැන් ඇත නොයෙක
සැබෑවෙන් තැවීගිය යෞවන සිතක
දුක් ගිනි නිවී යයි වයසට ගිය කලෙක

දකිමින් සැබෑ තතු එහි ඇති ලෙසින් පෙනී
ඇත්ත ඇති පරිදි මැදහත් සිතින් දැනී
දුරු වී සිත් තැවුල් දුක්ගිනි වෙමින් තුනී
පැමිණේ මහළු විය නුවණින් උදන් ඇනී

ඇතුටත් ගිය නුවණ ඇදගනු බැරි දෙයකී
සිහිනෙකි අනා කල ඇත්තකි කිව නොහැකී
හැම මොහොතක්ම එහි ඇති සැටි දැකිය හැකී
දිවි තතු කියා දෙන අගනා සිප් හලකී

ජීවිත ගෙවන්නයි ජීවිත ලැබෙන් නේ
කාලය අගය ජීවිතයෙහි තියෙන් නේ
සංසාරෙදිම නිවනත් මතු කෙරෙන් නේ
සංසාරෙම නිවන පවතින හෙයින් නේ

♦ මහාචාර්ය ටී. එස්. අබේවික්‍රම
Harrow UK

## ගලක් විය හදවත

දරුවන් අපේ ලෝකයෙ රජ වෙලා ඇත
ඒ හින්දා ජීවත්වෙයි හතර අත
නව අවුරුද්ද අත ළඟටම ඇවිත් ඇත
මැණිකෙයි මමයි මහගෙයි තනිවෙලා ඇත

අදවත් පුතුන් ඒ දැයි මග බලා ගෙන
ඉන්දැදි හෙලූ කඳුළු බිඳු මුව තුළට පැන
රුරා ගොසින් හද තිබු තැන නිදන් වින
සුදු මුදු හදක් වෙනුවට කළු ගලක් කැන

දරුවන් සැප විඳියි ලෝකයෙ දුකක් නැහැ
මැණිකේ මා ළඟයි මට තනියකුත් නැහැ
උඩු යටිකුරු වුනත් ලොව ගානකුත් නැහැ
කඳුළු වෙලා උණු වෙන්නට හදක් නැහැ

♦ කුමාරි විජේරත්න
Hounslow Middx UK

### සිංහල තේරවිලි කවි

මෙතක් සිතේ නැති වුන් කට්ටියක් නිදී
එකෙක් රැගත් අනිකෙක් හිස ගලක මැදී
ගොඩක් නපුරු තවකෙක් උපනි එත නදී
යකෙක් නොවේ යකෙකුද ඔහු හට පරදී

**පිළිතුර :**

තිබුණට සවිය නොකියනු රළු බස් කපට
ගරුකොට කියනු මැන ගරු කළ යුතු දැයට
ඉවුමට පිසීමට ඈ කටයුතු වලට
සැමවිට පිහිට වෙයි ගිනිපෙට්ටිය අපට



## Would You Follow ?

How many would follow the star tonight
If it shone past the Milky Way,
Leave comfortable homes and follow it still,
Over the hills and away.

How many would open their doors tonight
For a weary and shabby pair ?
Make room at hearths for a Stranger-Child,
Though the Infant be wondrous fair ?

How many would give of their goods tonight,
The best they possess and more,
For their faith in a star and an angel choir
And a King forevermore?

We censure the folk of a bygone time
For indifference to Mary's plight.
How many would do any better now?
Would you follow the star tonight?

- **Author Unknown**



## AT SIGIRIYA

A mortal fear of his sibling brother
King Kasyapa (5th century A.D.)
turned a massive rock
Into both palace and fortress.

The 200 metre high Sinha-Giri ( Lion Rock)
Is there for all to climb.

To see it bathed in moonlight on Poya Day
While an elephant trumpets in the forest
Is dream come true!

♦ **Denis Janz** **London NW8**

## අස්ම්මානය

ලෙඩවී සිටින අප්පා හට පොවන් නට
ලුණු කැඳ ටිකක්වත් නැහැ නොවැ හදන් නට
වී පැදුරක් තිබේ පුතුගේ මිදුල පිට
බොල් වී කරල් ආවේ ලෙඩ ඇඳ ළඟට

කුඹුරේ හේන කමතේ වැඩ කළ දාට
කවි සීපද තාලෙය කිව්වේ රැට
ගෝන මුවන් සාවුන් රැළ එළ වන්ට
හයි හත්තියක් නැත දැන්නම් නැගි ටින්ට

කණ අස්සම ගස් ලියවා ගත් උන්ට
තිබෙනා එකම දෙය තව බෙදලා දෙන්ට
කැමතිද පුතුනි සතුටින් එය අර ගන්ට
වැඩි පංගුව ගියේ කාටද දැන ගන්ට

ගොනුගෙ පිටට බැරි බර කර පට වන්ට
ඌ අදිනවා හතිදාගෙන පණ යන්ට
කැරකෙන චක්කරේ රෝදේ ගැල වෙන්ට
නුඹයි පුතේ ඊළඟ කර ගොනු වෙන්ට

♦ වසන්තා කුමාරි දසනායක
මයිලවලාන කිරිඳිවැල Sri Lanka

## ක්‍රිතු උපත

රැයේ සරදා කාසයේ
දිලි දිලී නැග ආ
තරුව මහ සළකුණු කියා
රජුන් එහි වැඩියේ

දිළිඳු ගව හල තුළ එදා
අසිරිමත් පුතණුන්
ලොවට බිහිවී එම රැයේ
නිදයි මව් ඇකයේ

සෙමින් ඇතුළට පිවිසෙමින්
පුදා තුටු පඬුරුත්
රජවරුන් තිදෙනා බැතින්
බිළිඳු පා නමදිත්

එසේ ගරු බුහුමන් කළේ
වෙසෙස් බිළිදෙකුටයි
ඒ බිළිඳු ලොකු මහත්වී
ලොවට සෙත දෙන්ටයි

♦ ක්‍රිෂාන්ති විරමන්
USA

## සංඝමිත්තාවෝ!


දම්සෝ නිරිඳු යුද වැදි ඒ සම යේදී
සටනින් බොහෝ ජීවිත වැනසුණු විටදී
නිමවූ මුත් සටන් සිත කලකිරුම යේදී
එතුමෝ දම් විජය ගැන සිත් යොමන ලදී

මොග්ගලිපුත් තෙරුන් වෙත ගොස් බණ අසලා
පැදී දහම් ඇස රජු මැනවින් සිතලා
තම පුත් මිහිඳු සසුනට පූජා කරලා
දියණිය සංඝමිත්තාවද මහණ කළා

සඝමිත් තෙරණියනි ඔබ ලක වැඩි හින්දා
සිරිමා බෝ සමිඳු ගෙන ඔබ ආ හන්දා
මෙහි තිබු ගණ අඳුර ඉන් නැතිවුණු හන්දා
නමදිමු මෙ ඔබ බැතියෙන් මුදුනත් රන්දා

මෙහෙණි සසුන මුල්වර මෙහි ඇති වීය
ලක්වැසි කතට යහපත ඉන් පැමි ණීය
සිහිකර එබව මෙ උතුම් උඳුවප් පෝය
පින්බර අහස පුරහඳ පායා ඒය

♦ එස්. කංකානම්ගේ
London SE5



## නිවී ගිය නැණ පහන

සිල් සුවඳ සිවු රය
ඉන් ආවරණ දෙවු රය
සහ විනය ඉවු රය
හිමි වටා තිබු
අපිස් පවු රය

සසුනඹර තරිඳුන්
තෙවලා දහම් සිරිදුන්
බොදු මගට දිරි දුන්
මවද බුදුවේ
හිමිට කිරි දුන්

අවිදු ගති නැති කැරු
අමිල බෝසත් ගුණ දැරු
සෝම හිමි අති ගරු
සිහිවටනයකි
සසුන ඇති තුරු

සීලයයි ගුණය යි
සංඝ සෝබන විනය යි
තිබුණ පෙර පිනය යි
පාත්තරයයි
සිවුරු දනය යි

වැරදි මත නැති විය
සදා ගතයුතු පැති විය
යළි අඳුර ඇති විය
ජාතියට තිබු
එළිය නැති විය

වෙහෙස වින්දේ මය
වැරදි මත බින්දේ මය
ලොවම වැන්දේ මය
සමිඳ ඔබ
බුදු රජුන්ගේ මය

**පූජ්‍ය ගංගොඩවිල සෝම හිමියන් අපවත්ව මේ මසට වසර 6 ක් පිරේ. මේ ඒ හිමියන් සිහිකිරීම පිණිසය.**

ජන විජය දුක් විය
මහජනතාව රොක් විය
ඉතිහසට එක් විය
මහිමි හෙළ විරු
බුදු පුතෙක් විය

හිමි වගේ පින් වත්
උතුමන්ට පුද සුන් ගත්
අපවතද කම් නැත්
තිබේ නිවනින්
නිවෙන සම්පත්

♦ කිව්පති - පාතකඩ කුලතිලක
Sri Lanka

## ස්නාවක වලප

මම ගෘහණියක්මි
අනුන්ගේ ගෙයක වසන
කොයි වේලේ මොනවා වේදැයි සිතන

මම බිරිඳක්මි
අනුන්ගේ සැමියෙකු සමග
ඉඩ ලද විට පමණක් පවුල් කන

මට පුතෙක් ඇත
ඒ සැමියාට සුජාත මුත්
අවජාතකයයි නම් ලද

මම මිතුරියක්මි
මිතුරියකැයි කිසිවෙකුත් නොකියන
එහෙත් ඔවුන්ගේ දුක අසන, සිත නිවන

මම බොළඳියක්මි
ඔහු හා අතිනත වෙළා
නුවර සිරි නරඹන්නට සිතන

මම පතිනියක්මි
කිසිදා අන් හිමි සමග නොගියද
වෛශ්‍යාව යයි නම් ලද

සත්තකින්ම මම ගැහැණියක්මි
ඒ නිසාවෙන් අනෙක දුක් විඳින
මම ගැහැණියක්මි
ඒ නිසාවෙන් විඳිය හැකි
හැම සැපම ලැබුණ!

අභාවප්‍රාප්ත
♦ වෛද්‍ය චන්ද්‍රිකා සිල්වා



## වාසිට් ගිය පුතේ

අමතක කර පවුලේ ගින්න
ගත් පඩිපත නුඹට දීලා
වාසිට්යට නුඹ යැව්වේ
මැරවරයෙක් කරන්න නොව

කඩු කිනිසි දැලිපිහියා ගල් මුගුරු
නොවෙයි පුතේ නුඹෙ පැන
විප්ලවයේ රාළ නොව
නුඹ තවමත් සිසුවෙක්ය

හෙට දිනට සින්න වෙයි
ගෙයි ඔප්පුව මුදලාලිට
කවදාද නුඹ එන්නේ
අරගෙන ඔය උපාධිය

♦ ප්‍රියන්ති අබේනායක
Paris 10 - France

## සයුරක කඳුළු



නිරුත්තර සිහිනයක් අබියස
මගේ හදවත හඬයි ඉකිබිඳ
නොවැද හෙමිහිට ඔබේ නෙත් සර
සනසවන්නේ කොහොම හදවත

තැනූදා මල් වියන් හැම තැන
හිඳීයයි හැමදාම මා ළඟ
බොඳව ගිය මල් සිහින කවිකොට
කියන්නම් දුක් ගීය සුළඟට
පැතූ පැතුමන් කඩා බිඳ ඔබ
යන්න ගිය දින මතක්වෙයි මට
වෙරළ සිප දහකරන රළ දැක
සයුර හැඬුවා හොරෙන් ඉකිබිඳ

♦ සමන්තිකා විජේසිංහ

## මට නොපෙනෙන ඈත

පාව යන්න මේ කුළක්ව නිල් අහස් ගැබෙන් එහා
ඈත කොයි දිසා ගියත් නැතේ බයක් නොඑයි කියා
ලෝකයේම ඉන්න හොඳම පෙම්වතා ඔබයි කියා
තාම දන්නෙ නැද්ද කීවෙ නැද්ද කවුරුවත් එසේ
ඒ වුනාට කෝ ඉතින් හිනා කිසිත් මුවේ නැතේ

♦ මල්කාන්ති ගුණරත්න Sri Lanka